සැකසුම - එම්.වී.සම්පත් බන්ධු ගුණසේකර - ර/බළ/වෙළහපොළ විද්‍යාලය


**<u>පුංචි දුවේ පුතේ, අම්මට හරි තාත්තට හරි මේ ප්‍රශ්න ටික අහන්න කියන්න.ඔයගොල්ලො උත්තර දෙන්න.</u>**

1. බුදු සසුනේ පැවිදි වූ මුල්ම කාන්තාව කවුද?
2. **යේ ධම්මා හේතුප්පභවා** යන ගාථාව කියන්න.
3. හොඳ මිතුරෙකු සතුව ඇති ගුණාංග තුනක් කියන්න.
4. සිල් වැඩසටහනට පෙර පාසලේ සිදුකරන කාර්යන් තුනක් නියන්න.
5. සිල් ඉල්ලීමේ වාක්‍යය කියන්න.
6. හොඳ නායකයෙකු සතු ගුණාංග තුනක් කියන්න.
7. මහාභිනිෂ්ක්‍රමණය යනු කුමක් ද?
8. සතර පෙර නිමිති පිළිවෙළින් කියන්න.
9. සිදුහත් තවුසා අධ්‍යාපනය ලබාගත් ගුරුවරු කවුද?
10. යසෝදරා දේවියට පුත් කුමරෙක් ලැබුණු පසු සිදුහත් කුමරුගේ මුවින් පිට වූ ප්‍රකාශය කුමක් ද?

**<u>දැන් අපි මේවට උත්තර ලියමු දුවේ පුතේ,</u>**

- පහත සඳහන් වැකි හරි නම් (√) ලකුණ ද වැරදි නම් (x) ලකුණ ද වරහන් තුළ

1. සිදුහත් කුමරුට පැවිදිවීමට සිවුරු පිරිකර පූජා කළේ සටීකාර බ්‍රහ්මණයා ය. (     )
2. සිරුරට දැඩි සේ සැප දීම මැදුම් පිළිවෙතයි. (     )
3. කිසාගෝතමියට බුදුරදුන් මුණගැසෙන්නේ ජේතවනාරාමයේ දී ය. (     )
4. ක්ෂණික ආහාරවලට අප පුරුදු විය යුතුය. (     )
5. කෝලිත පිරිවැජියා උපතිස්ස නැමින් පැවිදි විය. (     )

- හිස්තැනට ගැළපෙන නිවැරදි පිළිතුර යටින් ඉරක් අදින්න.

1. උපතිස්ස හා කෝලිත දෙමිතුරන්ගේ මුල්ම ගුරතුමා .................. ය. (සංජය පිරිවැජිතුමාය / අස්සජි මහ රහතන් වහන්සේ )
2. දකුණත් අගසව් වූයේ .............. හිමිය. ය (සැරියුත්/ මුගලන් )
3. සිදුහත් කුමරු ගිහි ගෙය හැර ගියේ ............... ඇමති සමඟ ය. (ජන්න/ දේවදත්ත )
4. නිබ්බුත පද කීවේ ................ ය. (යශෝදරාව / කිසා ගෝතමී )
5. සිදුහත් කුමරු ගිහිගෙයින් පිට වූයේ ................ අසු පිට ය. (කන්ථක / කුම්භක)

සෑම දෙනාම පරිස්සමට ගෙදර ඉන්න. බුදු සරණයි !